VIBAT MALDAMA.

# විබත් මල්දම.

කිරම ධම්මාරාම තෙරුන්වහන්සේ
විසින් රචනාකරණලදි.

උගත් සථවිරයන්වහන්සේ කෙනෙක්
විසින් ලියනලද සන්න සහිතයි.

මාතර
ජේ. ජී. කරෝලිස් අප්පුහාමි විසින්
අළුත්ගම
සධර්මප්‍රකාශ යන්ත්‍රාලයෙහි
මුද්‍රණය කරවනලදී.

ක්‍රි. ව. 1906.

# සඥාපනය.

විබත්මල්දම නම්වූ මෙම පොත සිංහල ව්‍යාකරණ ඉගෙණගන්න ආධුනිකයන්ගේ ප්‍රයොජනය පිණිස කිරම ධම්මාරාම ස්ථවිරයානන් වහන්සේ විසින් රචනාකරණලද්දක්ය. මුන්වහන්සේ නම් මිට අසූ පස් වර්‍ෂයකට පමණ පෙර මාතර පලාතට අයත් ගිරුවාපත්තුවබද ගොඩපිටිය නම් ග්‍රාමයෙහි මහාවිහාරයෙහි වැඩවිසූ එළු පාලි සංස්කෘතාදි නානා ශාස්ත්‍රයන්හි විසාරද ඥානයක්ඇති පණ්ඩිත රත්නයෙක්ය. මුන්වහන්සේ විසින් මෙම පොත පමණක්නොව සියබස්මල්දම ආදි තවත් පොත් රාසියක්ම රචනාකර තිබේ. ශාස්ත්‍ර සම්බන්ධ උන්වහන්සේ කෙරෙහි පැවතුනු ව්‍යක්තභාවය ගැන එම පොත් කියවන්නාවූ පණ්ඩිත ජනයා ශාක්ෂි දරණවා ඇත. මුන්වහන්සේ වැඩවිසූ මාතර ගොඩපිටියේ ජේතවනාරාමයෙහි කෙරුණු මහා පින්කම උදෙසා තෝමිස් මුහන්දිරම් මහතා විසින් රචනාකරන්ට යෙදුනු ගඞ්ගාරෝහන වර්ණනාව නම් පොත සම්බන්ධව සිද්ධවූ සව්සත්දම් වාදය නම් මහා වාදය සිහිපත්කල පමණින්ම ලක්වැසි කවුරුත් පාහේ උන්වහන්සේ ගැන දන්නවා ඇත. එසේහෙයින් එබඳු චිරප්‍රසිද්ධ උත්තමයෙක් විසින් ආධුනිකයන්ගේ ප්‍රයොජනය සඳහා කරණලද මෙම පොත අච්චු ගැස්වීමෙන් ඇති ප්‍රයෝජනය වැටහුනු මාවිසින් මුල් පොත් කීපයක් සපයා බලමින් පෙරඅච්චු ගසා තිබුනු පොතටත් සංස්කාර මෙය මේවර ප්‍රසිද්ධ කලෙමු.

මෙබවට,

06. 10. 25 K. G. KAROLIS APPUHAMI.

# නමව් මුණිසරණ.

**නැමද අප දිසබජ් නෙකඳනට වැඩ සඳහා පොරනැදුරුබස්ගෙණ කරනෙම් විබත්මල්දම්.**

පෙරවිබත්, අලප්විබත්, කම්විබත්, කතුවිබත්, කරණවිබත්, සපදන්විබත්, අවදිවිබත්, සබඳවිබත්, අදරවිබත්, යන සත්විබත් පිළිවෙළින් පවසම්—එහි **පෙරවිබත් එකබසනම්.**

---

අපදිසබජ්, අපගේ ජගත්පිතෘ; (**සර්වඥයා**) නැමද, නමස්කාරකොට; නෙකඳනට, අනෙකජනයාගේ; වැඩසඳහා, අභිවෘද්ධිය පිණිස; පොරණැදුරු, පුරාණාචාර්යවරයන්ගේ; බස්ගෙණ, වචනග්‍රහණයකොට; විබත්මල්දම්, විභක්ති මාලාදාමනම්(ප්‍රකරණයක්;) කරනෙම්, කරයෙනම්.

පෙරවිබත්, ප්‍රථමාවිභක්තිය; අලප්විබත්, ආලපනවිභක්තිය; කම්විබත්, කර්ම විභක්තිය; කතුවිබත්, කර්තෘවිභක්තිය; කරණවිබත්,කරණවිභක්තිය; සපදන්විබත්,සම්ප්‍රදානවිභක්තිය;අවදිවිබත්,අවධිවිභක්තිය; සබඳවිබත්, සම්බන්ධවිභක්තිය;අදරවිබත්,ආධාරවිභක්තියයන, කියන; සත්විබත්,¶සප්තවිභක්තීන්; පිළිවෙළින්,පටිපාටියෙන්; පවසම්, ප්‍රකාශකරම්.

එහි, ඒසප්තවිභක්තීන් අතුරෙහි; පෙරවිබත්එකබස නම්, ප්‍රථමාවිභක්ති එකවචනයනම්.

---

¶ මෙහි සප්තවිභක්තියයි කීවේ ආලපනය ප්‍රථමාවටද කරණය කර්තෘවිභක්තියටද ඇතුලත්හෙයිනි.

1 මුණිඳේ **දම්**දෙසේ, දිනිඳ අඳුරු වැනසී, මැතිඳ නඩුඅසා, නිරිඳෙක් රුපුන් ජයගනි,-බුහුබ**සනම්**—
දෙවියෝ අසිරිදෙත්, අසුරෝ හරුට **පරදිත්**, බමුණුහු **මතුරු** උගණිත්, පඬුවෝ දෙසක් නොකරත්.

2 පෙරවිබතටම ඇතුලත් **අලප්විබත් එකබසනම්**
**මහරද ලෙව් නොනස, පුතැ සව්සත** උගණුව, **සඳ** ම
න කොඳපොබ, මැතිඳේ දුසිරි නොකරව. **බුහුබසන**
**ම්**=කිවිති ගත් උගණිව්,

---

1 මුණිඳේ, සර්‍වඥතෙම; දම්, ධර්‍මය, දෙසේ, දෙශනාකෙලේය; දිනිඳ, දිනේන්‍ද්‍රතෙමේ; අඳුරු, අන්‍ධකාරය; වැනසී, විනාසකෙළේය; මැතිඳ, අමාත්‍යවරතෙමේ; නඩු, අධිකරණයන්; අසා, අසයි; නිරිඳෙක්, නරේන්‍ද්‍රයෙක්; රුපුන්; සතුරන්; ජයගනි, ජයගන්නේය; බුහුබසනම්, බහුවචනයනම්; දෙවියෝ, දේවතාවෝ; අසිරිදෙත්, ආශිර්‍වාද දානයකෙරෙත්; අසුරෝ, දානවයෝ; හරුට, විෂ්ණුට; පරදිත්, පරාජයවෙත්; බමුණුහු, බ්‍රාහ්මණයෝ, මතුරු, මන්ත්‍ර; උගණිත්, උද්ග්‍රහණය කරත්; පඬුවෝ, පණ්ඩිතයෝ; දෙසක්, දොෂයක්; නොකරත්, නොකරති.

2 පෙරවිබතටම, ප්‍රථමාවිභක්තියටම; ඇතුලත්, අන්තර්ගතවූ; අලප්විබත් එකබසනම්, ආලපන විභක්ති එකවචනයනම්; මහරද, මහාරාජය; ලෙව්, ලෝකසත්ත්‍වයා; නොනස, විනාසනොකරව; පුතැ, පුත්‍රය; සව්සත, සිය්ලුශාස්ත්‍රය; උගනුව, උද්ග්‍රහණයකරව; සඳ, චන්ද්‍රය; මනකොඳ, මනස්කෞමදයන්; පොබ, ප්‍රබොධකරව; මැතිඳේ, මන්ත්‍රීන්ද්‍රය; දුසිරිනොකරව, දුශ්චරිතය නොකරව.

බුහුබසනම්, බහුවචනයනම්; කිවිනි, කවිවරුනි; ගත්, ග්‍රන්ථයන්; උගනිව්, උද්ග්‍රහණයකරව්;

මිතුරෙනි නොමද සෙත දෙව්, සත්නෙනි පින්කරව්, සිත්නි අවැඩක් නොසිතුව්.

3 **කම්විබත් එකබසනම්**=මුණිසඳ නමකරව, සත් විදු යෙහෙන් උගනුව, මැනිඳ බලාඑව, මරහුදින පි න්බලයෙන්.

**බුහුබසනම්**—මහණුන් නමදනේ, පිළිමල්න නිති ජයගනු, මොනරාන නරඹන්න, රුක්නට නැගෙත් වඳුරෝ.

4 **කතුවිබත් එකබසනම්,** රම්රදගත් දසවෙස්, නි රිඳුකල තදයුද, සිරදනැසූ ගජකැල.

---

මිතුරෙනි, මිත්‍රවරුනි; නොමද, බොහෝවූ; සෙත, සා න්තිය;දෙව්, දානය කරව්; සත්නෙනි, සත්පුරුෂයෙනි; පින්කරව්, කුසල්කරව්; සිත්නි,චිත්තයෙනි; අවැඩක්, අනභිවෘද්ධියක්; නොසිතව්, චින්තනය නොකරව්.

3 කම්විබත් එකබසනම්,කර්මවිභක්ති එකවචනයන ම්; මුණිසඳ, මුණීන්ද්‍රයා;නමකරව,නමස්කාරකරව; ස ත්විදු, සහපත් විද්‍යාවන්; යෙහෙන්, යහපත් පරිච්ඡෙද න්; උගනුව, උද්ග්‍රහණය කරව; මැනිඳ, මනීන්ද්‍රයා, බලා, නරඹා;එව,ආගමණයකරව;මරහු,මාරයා;පින්බ ලයෙන්, පුණ්‍යශක්තියෙන්; දින,ජයගනුව; බුහුබසන ම්, බහුවචනයනම්; මහණුන්, ශ්‍රමණයන්; නමදනේ, නමස්කාර කරන්නේය; පිළිමල්න, ප්‍රතිමල්ලයන්; (පොරටඑන්නන්) නිතිජයගනු, නිරන්තරයෙන් ජය ග්‍රහණය කරව්; මොණරාන, මයූරයන්; නරඹන්න, බලන්න;රුක්නට, වෘක්ෂයන්ට;වඳුරෝ, වානරයෝ; නැගෙත්, ආරූඪවෙත්.

4 කතුවිබත් එකබසනම්, කර්තෘවිභක්ති එකවචන යනම්; රම්රද, රාමරාජයාවිසින්; ගත්, ගණ්ණාලද; දසවෙස්; දශවිධවේශය; නිරිඳු, නරේන්ද්‍රයාවිසින්; ක ළ, කරණලද; තදයුද, දෘඪවූයුධයි; සිරද, සිංහරාජ යා විසින්; ගජකැල, හස්තිසමූහයා;නැසූ, නසනලදී;

රුසිහුවදහළ මහගත් — බුහුබසනම්, බිළිදුන් කළනැටුම්, මීපල්නගන් මඩලග, නරානකළ දුසිරි, කිවින් පදකල කව්පද.

**5** මෙම කතුවිබතටම ඇතුලත් **කරණවිබත් එක බසද** **බුහුබසද**, එකලෙසමයි, යසින් ලොවැ පළවේ, ගුණෙන් සව්සත සිත්ගනු, මෙත්නෙන් වෙරනසනු, සිත්නි හැමදෙය විමසනු.

6 **සපදන් විබත් එකබසනම්,** තිලොවට උතුම්

---

රුසිහු, ඍෂිහු විසින්; මහගත්, මහාග්‍රන්ථය, වදහළ, වදාරණලදී; බුහුබසනම්, බහුවචනයනම්, බිළිඳුන්, ළදරුවන් විසින්; කළ, කරණලද; නැටුම්, නෘත්‍යයි; මීපල්න, මහිපාලයන්විසින්; ගත්, ගණණලද; මඩලග, මණ්ඩලාග්‍රයි; (කඩු) නරාන, මනුෂ්‍යයන් විසින්; කළ, කරණලද; දුසිරි, දුශ්චරිතයි; කිවින්, කවින් විසින්; පදකල, ප්‍රබන්ධකරණලද; කව්පද, කාව්‍යපදයි

**5** මෙම කතුවිබතටම, මේ කර්තෘවිභක්තියටම; ඇතුලත්, අන්තර්ගතවූ; කරණවිබත් එකබසද, කරණවිභක්ති එකවචනයද; බුහුබසද, බහුවචනයද; එකලෙසමයි, ඒකාකාරමයි; යසින්, යශස් කරණකොට ගෙණ; ලොවැ, ලොකයෙහි; පළවේ, ප්‍රකාශවේ; ගුණෙන්, ගුණයකරණකොටගෙණ; සව්සත, සියලුසත්ත්වයන්ගේ; සිත්ගනු, චිත්තග්‍රහණය කරව; මෙත්නෙන්, මෛත්‍රිය කරණකොටගෙණ; වෙර, වෛරය; නසනු, විනාසකරනු; සිත්නි, චිත්තය කරණකොට ගෙණ; හැමදේ, සියළුදේ; විමසනු, පරීක්ෂාකරණු.

6 සපදන්විබත් එකබසනම්, සම්ප්‍රදානවිභක්ති එකවචනයනම්; තිලොවට, තුන්ලොවට; උතුම්, උත්තමවූ;

මුණිසඳුට පුදම්මල්, මිතුරාට සැපදෙව්,රුපුහට සිදුරු නොකියව—බුහුබස නම්- බමුණන්ට දනදෙනු, මහතුන්ට සතුරු නොවව්,සුරණට සතුරුදිත්, නරානට නිගා නොකරව.

7 **අවදිවිබත් එකබසනම්.** ගසින්ගිලි මිනිසෙක්, දනයෙන් තොරවි මැතිදෙක්, හිරුගෙන් රැස්දිවේ, සඳහුගෙන් සොමිගුණවේ—**බුහුබස නම්**—යකුන්ගෙන් උවදුරුවේ, නරන්ගෙන් කැත්උකට, රුසින්ගෙන් සුව වැඩිවේ, රුක්නගෙන් හුනුවඳුරෝ.

---

මුණි සඳුට, මුනීන්‍ද්‍රයාට; මල්, පුෂ්පයන්; පුදම්, පූජාකරම්; මිතුරාට, මිත්‍රයාට; සැපදෙව, සුව දානයකරව; රිපුහට, සතුරාට; සිදුරු, ඡිද්‍රයන්; නොහොත් දොෂ; නොකියව, කථනය නොකරව;. බුහුබසනම්, බහුවචනය නම්; බමුණන්ට, බ්‍රාහ්මණයන්ට; දන, දානය; දෙනු, දානය කරනු; මහතුන්ට, මහත්මයන්ට; සතුරුනොවව්, විරුඬනොවව්; සුරණට, දෙවියන්ට; දිත්, අසුරයෝ; සතුරු, සතුරෝය; නරානට, මනුෂ්‍යයින්ට; නිගානොකරව, නිග්‍රහ නොකරව.

7 අවදිවිබත් එකබස නම්, අවධිවිභක්ති එකවචනය නම්; ගසින්, වෘක්ෂයෙන්; මිනිසෙක්, මනුෂ්‍යයෙක්; ගිලි, ගලිතවි; දනයෙන්, වස්තුවෙන්; මැතිදෙක්, මන්ත්‍රීන්ද්‍රයෙක්; තොරවී, තුරන්වූයේය; හිරුගෙන්,සූර්‍ය්‍යාගෙන්; රැස්, රශ්මිය; දිවේ, ධාවනයකෙරේ; සඳහුගෙන්, චන්ද්‍රයාගෙන්; සොමිගුණ, සෞම්‍යගුණය; වේ, වෙයි; බුහුබසනම්, බහුවචනය නම්; යකුන්ගෙන්, යක්ෂයින්ගෙන්; උවදුරු වේ, උපද්‍රව වෙයි; නරන්ගෙන්, මනුෂ්‍යයන් කෙරෙන්; කැත්, ක්ෂත්‍රියතෙම; උකට, උත්කෘෂ්ටයි; රුසින්ගෙන්, ඍෂීන්ගෙන්; සුව වැඩිවේ, සුබාභිවෘඬියවේ; රුක්නගෙන්, වෘක්ෂයන්ගෙන්; වඳුරෝ, වානරයෝ; හුනු, පතිතවූහ.

8 **සබඳවිබත් එකබසනම්,** මවගේසිත පෙම්නදි, සඳුගේ පිත් සොමිවේ, සොරාගේ සිත නපුරි, රජහු ගේ පිරිස බලවති,=**බුහුබසනම්**=නරන්ගේ **දනදනී** ඇතුන්ගේ දිගුදළ, රුක්නගේ අතුපතර, තඹරාන ගේ දලපෙළ.

9 **අදරවිබත් එකබසනම්,** ලක්දිවැ රජෙක්වි, මෙ ලෙකෙහි සතුරු වියවුල්, කොටුවේ වෙඩි ඇසේ, සිතෙ හි තදබිය උපදි.—**බුහුබස නම්**-තඹරන්හි මිවේ,

---

8 සබඳවිබත් එකබස නම්, සම්බන්ධවිභක්ති එකවච නයනම්; මවගේ, මාතෘවගේ; සිත, චිත්තය තෙම; පෙමින්, ප්‍රේමයෙන්; අදි, ආද්‍රයී නොහොත් තෙත්වී; සඳුගේ, චන්ද්‍රයාගේ; පිත්, පුත්‍රතෙම; සොමිවේ, සෞම්‍යයාවේ; (බුදහු) සොරාගේ, චෞරයාගේ; සිත, චිත්තයතෙම; නපුරි, නපුරුයි; රජහුගේ, රාජයාගේ; පිරිස, පෂිත්තොම; බලවතී, බලවත්තායි-බුහුබස නම්, බහුවචනයනම්; නරන්ගේ, මනුෂ්‍යයන්ගේ; දන, ව ස්තුව; දනී, දානශනී; ඇතුන්ගේ, හස්තීන්ගේ; දළ, දන්තාවෝ; දිගු, දීඝියි; රුක්නගේ, වෘක්ෂයන්ගේ; අතු, ශාඛාවෝ; පතර, මහත්; තඹරානගේ, තාමරසයන් ගේ; දල පෙළ, පත්‍ර පඞ්ක්තියයි.

9 අදරවිබත් එකබසනම්, ආධාරවිභක්ති එකවච නයනම්; ලක්දිවැ, ලඞ්කාවිපයෙහි; රජෙක්වී, නිරි දෙක් වූයේය; මෙලකෙහි, මේ ලඞ්කාවෙහි; සතුරුවි යවුල්, සතුරන්ගේ අවුල්ය; කොටුවේ, කුසුලයෙහි; වෙඩි ඇසේ, වෙඩිඇසෙයි; සිතෙහි, චිත්තයෙහි; තදබිය, දෘඩ භීතිය; උපදී, භවගණියි; බුහුබසනම්, බහුවචන යනම්; තඹරන්හි, තාමරසයන්හි; මි, මධු; වේ, වෙයි.

මල්වල ඹිගු හැසිරෙත්, සතන්හිලාදරවි, සතුරන් කෙරෙහි කගිගුණ, සත් විබත් නිමි.

| | | එකබස. | බුහුබස. |
|---|---|---|---|
| 10 | පෙර | සඳේ | සඳහු |
| | අලප් | සඳ | සඳෙනි |
| | කම් | සඳු | සඳුන් |
| | කතු | සඳහු (විසින්) | සඳුන් (විසින්) |
| | කරණ | සඳ(කරණකොට, | සඳුන්(කරණකොට) |
| | සපදන් | සඳට | සඳනට |
| | අවදි | සඳෙන් | සඳනෙන් |
| | සබඳ | සඳුගේ | සඳනගේ |
| | අදර | සඳෙ | සඳන්හි |

මල්වල, පුෂ්පයන්හි; ඹිගු, *භෘඞගයෝ; හැසිරෙත්, සඤ්චාරණය කෙරෙත්; සතන්හි, සන්තානයන්හි; ලා, බහා; දරවි, ධාරණය කරවි; සතුරන් කෙරෙහි, පඝ මිතුරන් කෙරෙහි; කගිගුණ, කවර ගුණයෙක්ද; සත් විබත්, විභක්ති සප්තකය; නිමි, සමාප්තයි.

I0 සඳේ, චන්ද්‍රතෙම; සඳහු, චන්ද්‍රයෝ; සඳ, චන්ද්‍රය; සඳෙනි, චන්ද්‍රයෙනි; සඳු, චන්ද්‍රයා, සඳුන්, චන්ද්‍රයන්; සඳහු විසින්, චන්ද්‍රයා විසින්; සඳුන් විසින්; චන්ද්‍රයන් (විසින්) සඳ (කරණකොට) චන්ද්‍රයා කරණකොට; සඳුන් කරණකොට, චන්ද්‍රයන් කරණකොට; සඳට, චන්ද්‍රයාට; සඳනට, චන්ද්‍රයන්ට; සඳෙන්, චන්ද්‍රයාකෙරෙන්; සඳනෙනි, චන්ද්‍රයන් කෙරෙන්; සඳුගේ, චන්ද්‍රයාගේ; සඳනගේ, චන්ද්‍රයන්ගේ; සඳෙ, චන්ද්‍රයාකෙරෙහි, සඳන්හි, චන්ද්‍රයන් කෙරෙහි.

සෙසු ශබ්දයන්ටද මෙසේ ප්‍රථමාදී සප්තවිභක්තීන්ගේ අර්ථකථනය දැනගත යුතු.

* මුල්පොත්හි ඹිඟුන් කියා තිබේ.

| | ඒකබස | බහුබස |
|---|---|---|
| පෙර | සුගත* | සුගතහු |
| අලප් | සුගතැ | සුගතෙනි |
| කම් | සුගතා | සුගතුන් |
| කතු | සුගතු | සුගතුන් |
| කරණ | සුගත්(කරණ-කොට | සුගතුන් (කරණ-කොට |
| සපදන් | සුගතුට | සුගතුන්ට |
| අවදි | සුගතුගෙන් | සුගතුන්ගෙන් |
| සබඳ | සුගතුගේ | සුගතුන්ගේ |
| අදර | සුගතේ | සුගතන්හි |
| පෙ | වියත † | වියත්හු |
| අ.ප් | වියතැ | වියතිනි |
| කම් | වියත | වියතුන් |
| ක | වියතු | වියතුන් |
| කර | වියතු | වියතුන් |
| ස | වියතහට | වියතුන්ට |
| අ | වියතුගෙන් | වියතුන්ගෙන් |
| ස | වියතුගේ | වියතුන්ගේ |
| අ | වියතේ | වියතුන්හි |
| පෙ | සැඩරුස් ‡ | සැඩරුස්හු |
| අ | සැඩරුස් | සැඩරුස්නි |
| කම් | සැඩරුස් | සැඩරුස්නට |
| ක | සැඩරුස් | සැඩරුස්න |
| කර | සැඩරුස් | සැඩරුස්න |
| ස | සැඩරුස්හට | සැඩරුස්නට |

* සඹුදු යන අර්ථයි.

† ව්‍යක්තයායනුයි.

‡ සූර්‍ය්‍යා යන අර්ථයි,

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| අ | සැඩරුස්හුගෙන් | සැඩරුස්නගෙන් |
| ස | සැඩරුස්හුගේ | සැඩරුස්නගේ |
| අ | සැඩරුස් | සැඩරුසන්හි |
| පෙ | සිදුහත් † | සිදුහත් |
| අ | සිදුහත් | සිදුහත් |
| කම් | සදුහත් | සිදුහත් |
| ක | සිදුහත් | සිදුහත් |
| කර | සිදුහත් | සිදුහත් |
| ස | සිදුහත් | සිදුහත් |
| අ | සිදුහත් | සිදුහත් |
| ස | සිදුහත් | සිදුහත් |
| අ | සිදුහත් | සිදුහත් |
| පෙ | කිවි * | කිවිහු |
| අ | කිවිය | කිවියෙනි |
| කම් | කිවියා | කිවින් |
| ක | කිවිහු | කිවින් |
| කර | කිවිහු | කිවින් |
| ස | කිවියාට | කිවින්ට |
| අ | කිවිහුගෙන් | කිවින්ගෙන් |
| ස | කිවිහුගේ | කිවින්ගේ |
| අ | කිවිහුකෙරෙහි | කිවින්කෙරෙහි |
| පෙර | රිවියා § | රිවිහු |
| අලප් | රිවියැ | රිවියෙනි |
| කම් | රිවිය | රිවින් |

† ගෞතමබුදුන් යන අර්ථයි

* පණ්ඩිත යන අර්ථයි.

§ හිරු

| | එකවචන | බහුවචන |
|---|---|---|
| කතු | රිවිහු | රිවින් |
| කරණ | රිවිහු | රිවින් |
| සපදන් | රිවිහට | රිවින්ට |
| අවදි | රිවිහුගෙන් | රිවින්ගෙන් |
| සබඳ | රිවියාගේ | රිවීන්ගේ |
| අදර | රිවිහුකෙරෙහි | රිවින්කෙරෙහි |

| | | |
|---|---|---|
| පෙර | පඬි † | පඬුවෝ |
| අ | පඬිය | පඬුවෙනි |
| කම් | පඬියා | පඬුවන් |
| ක | පඬිහු | පඬුවන් |
| කර | පඬිහු | පඬුවන් |
| ස | පඬිහට | පඬුවන්ට |
| අ | පඬියාගෙන් | පඬුවන්ගෙන් |
| ස | පඬියාගේ | පඬුවන්ගේ |
| අ | පඬිහු(කෙරෙහි) | පඬුවන්(කෙරෙහි) |

| | | |
|---|---|---|
| පෙ | සකි § | සකියා |
| අ | සකියැ | සකියෙනි |
| කම් | සකිනු | සකින් |
| ක | සකියා | සකින් |
| කර | සකිහු | සකින් |
| ස | සකියාට | සකින්ට |
| අ | සකිහුගෙන් | සකින්ගෙන් |
| ස | සකියාගේ | සකියන්ගේ |
| අ | සකියාකෙරෙහි | සකියන්කෙරෙහි |

† පණ්ඩිත

§ මිත්‍ර යන අර්ථයි.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පෙ | ගුරු * | ගුරුහු |
| ආ | ගුරුව | ගුරුනි |
| කම් | ගුරා | ගුරන් |
| ක | ගුරුහු | ගුරුන් |
| කර | ගුරුහු | ගුරුන් |
| ස | ගුරුහට | ගුරුන්ට |
| අ | ගුරුගෙන් | ගුරුන්ගෙන් |
| ස | ගුරුගේ | ගුරුන්ගේ |
| ආ | ගුරුකෙරෙහි | ගුරුන්කෙරෙහි |

| | | |
|---|---|---|
| පෙ | මරු † | මරුවෝ |
| ආ | මරුව | මරුවෙනි |
| කම් | මරුවා | මරුවන් |
| ක | මරුහු | මරුවන් |
| කර | මරුහු | මරුවන් |
| ස | මරුවාට | මරුවන්ට |
| අ | මරුවාගෙන් | මරුවන්ගෙන් |
| ස | මරුවාගේ | මරුවන්ගේ |
| ආ | මරුවකෙරෙහි | මරුවන්කෙරෙහි |

| | | |
|---|---|---|
| පෙ | මම‡ | අපි ඇප් |
| කම් | මා | අප අප් |
| ක | මාවිසින් | අපවිසින් |
| කර | මාකරණකොට | අපකරණකොට |
| ස | මට | අපට අපහට |
| අ | මාගෙන් | අපෙන් අපගෙන් |
| ස | මාගේ | අපේ අපගේ |
| ආ | මාකෙරෙහි | අපකෙරෙහි |

* ආචාර්‍ය්‍ය යන අර්ථයි.
† මාරයා යන අර්ථයි.
‡ අෂ්මත් යන අර්ථයි.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පෙ | තෝ * | තෙප් |
| කම් | තා | තෙපි තොප තොපි |
| ක | තාවිසින් | තොපිවිසින් |
| කර | තා කරණකොට | තොප කරණකොට |
| ස | තට තොට | තොපට තෙප්හට |
| අ | තාගෙන්- තොගෙන් | තොපෙන්- තොපගෙන් |
| ස | තාගේ තොගේ | තොපේ තොපගේ |
| අ | තා කෙරෙහි- තෝ කෙරෙහි | තොපකෙරෙහි- තොපි කෙරෙහි |

**සත් විබත් පිළිවෙළ නිමි.**

11 අන්කරු තසදකරු මසදකරු තෙකල්කිරිය සැකෙවින් පවසම්— එහි **අන්කරු අයුකල් එක බස නම්**- දීපංකරමුණි යමාඉදුකළේ, සව්ලෝද එනරඹා තිවී,

---

සත් විබත් පිළිවෙල, සප්තවිභක්තික පටිපාටිය; නිමි, නිෂ්ඨායි.

11 අන්කරු, අන්‍යකාරක; තසදකරු, තශබ්දකාරක; මසදකරු, මශබ්දකාරක සම්බන්ධවූ; තෙකල්කිරිය, ත්‍රෛකාලික ක්‍රියාව; සැකෙවින්, සංක්ෂේපයෙන්; ප...ම්, ප්‍රකාශකරම්; එහි, ඒ ත්‍රෛකාලික ක්‍රියාවන් අතුරෙහි; අන්කරු, අන්‍යකාරක; අයුකල් එකබසනම්, අතීතකාලික එකවචනය නම්; දීපංකරමුණි, දීපඞ්කර සර්වඥතම; යමාඉදු කෙළේ, යමක ප්‍රාතිහාර්‍ය කෙළේයි; සව්ලෝද, සකල ලොකධාතු තොම; එනරඹා, ඒ යමක ප්‍රාතිහාර්‍ය බලා; තිවී, තුෂ්ටවූ;

---

* යුෂ්මත් යන අර්ථයි.

මහදෙනේ කෙලෙසුන් වැනගී, එතන බුදුසිරි සයුරෝරේ කුමුටු; **බුහුබසනම්=** පෙර රුසිහු මහගත් ගෙතු ගෙතුහු, පෙර පඬිහු අරුත් පළකලෝ කළහ කළහු, පෙර නියවත්හු උගතතු උගත්හු උගත්හ, පරසෙන් බුන් බුන්හු බුන්හ.

12 **අන්කරු වත්මන්කල් එකබසනම්**, දූන් අප සැසිහු නවඟ සසුන් පවතී, දූන් මුළුලෙව් ඔබ දහ මොද බෝ, දූන්ඔබ අරිසඟ තොටුවන් දෙනේ, දූන් ඒ තුන්රුවන් නියවත් පුද,

---

මහදෙනේ, මහජන තෙමේ; කෙලෙසුන්, කෙලශය න්; වැනගී, විනාශ කෙලේයි; එතන, ඒ ස්ථානයෙහි; බුදුසිරි, බුඩශ්‍රීනැමති; සයුරෝරේ, සාගරෝදරයෙහි; කුමුටු. ගිලුනේය; බුහුබසනම්, බහුවචනය නම්; පෙරරුසිහු, පූර්වසෘෂිවර ...; මහගත්, මහාග්‍රන්ථයන්; ගෙතු, ග්‍රන්ථනයකලෝ; ...ගතුහු යනුද මෙම අර්ථයි; පෙරපඬිහු, පුරාණපණ්ඩිත...; අ...ත්. අර්ථ; පළකලෝ, ප්‍රකාශකලාහුය; කළහ. ක...හු කියාදෙවි; පෙර, පූර්වයෙහි; නියවත්හු, ඥාණ...නතයෝ; උගතතු, උද්ග්‍රහනයකලෝ; උගත්හු උගත්හ යනු මෙමඅර්ථයි; මරසෙන්, මාරසේනාව; බුන්, බිඳුහ; බුන්හු බුන්හ යනුද මෙම අර්ථයි.

12 අන්කරු, අන්‍යකාරක; වත්මන්කල්, වර්තමාන කාලික; එකබසනම්, එකවචනය නම්; දූන්, මේකාල යෙහි; අපසැසීහු, අපශාක්‍යසිංහයාගේ; නවඟසසුන්, නවාඞග ශාසනයතෙම; පවති, පවතියි; දූන්, මේකාලයෙහි, මුලුලෙව්, සකලලෝකයතෙම; ඔබදහම් ඔද, උන්වහන්සේගේ ධර්මාමෘතය; බෝ, පානයකෙරෙයි; දූන්, මේකාලයෙහි; ඔබඅරිසඟ, උන්වහන්සේගේ අර්ය්‍යසංඝතෙම; තොටුවන්, තීර්ථිකයන්; දෙනේ, ජය ගණී; දූන්, මේකාලයෙහි; ඒ තුන්රුවන්, ඒ රත්න ත්‍රය, නියවත්, ඥාණවන්ත තෙම; පුද, පූජාකරයි;

**බුහුබස නම්**. දැන්වත්වත්හු මුණිගුණ වණත්, දැන් ළැඇතියෝ විඳිත්, දැන් දනැතියෝ දන්දෙත්, දැන් උඩනුවෝ මෙර බොත්.

**13 අන්කරු අනාකල් එකබස නම්**, මතු මෙතේ දිනිඳු පස්මරුන් දනන්නේ, එමුණි අපවග අමා දෙන්නේ, එඅමා මහදෙනේ බොන්නේ, එඋලෙලෑ පොසොන් වැසි වස්නේ. **බුහුබසනම්**, මතු මෙතේදිනිඳු පුදන්නෝ, එසස්නෙහි පැවිදිවන්නාහ වන්නාහු;

---

බුහුබස නම්, බහුවචනය නම්; දැන්, මෙකල්හි; වත් වත්හු, මුඛවන්තයෝ; මුණි ගුණ, සර්වඥ ගුණය; වණත්, වර්ණනා කරත්; දැන්, මෙකලැ; ළඇතියෝ, සිත් ඇත්තෝ; විඳිත්, එය ලබත්; දැන්, මේ කාලයෙහි; දනැතියෝ, ධනවන්තයෝ; දන්, දානය; දෙත්, දානය කරත්; දැන්, මේ කාලයෙහි; උඩනුවෝ, අඥානයෝ; මෙර, මෙරය; බොත්, පානයකරත්.

13 අන්කරු, අන්‍යකාරක; අනාකල්, අනාගතකාලික; එකබස නම්, එකවචනය නම්; මතු, අනාගතකාලයෙහි; මෙතේදිනිඳු, මෛත්‍රෙය ජිනේන්ද්‍රතෙම; පස්මරුන්, පඤ්චමාරයන්; දනන්නේ, ජයගන්නේය; එමුනි, ඒ සර්වඥතෙම; අපවගඅමා, නිර්වාණාමෘතය; දෙන්නේ, දානය කරන්නේය; එ අමා, ඒ අමෘතය; මහ දෙනේ, මහජන තෙමේ; බොන්නේ, පානය කරන්නේය; එ උලෙලෑ, ඒ උත්සවයෙහි, පොසොන් වැසි, මල්වර්ෂාව; වස්නේ, වර්ෂා කරන්නේය; බුහුබස නම්, බහුවචනය නම්; මතු, අනාගතයෙහි; මෙතේදිනිඳු, මෛත්‍රෙය සර්වඥයන්; පුදන්නෝ, පූජාකරන්නෝයි; එසස්නෙහි, ඒ ශාසනයෙහි; පැවිදිවන්නාහ, මහණවන්නාහුය; වන්නාහුය නුදු මෙම අර්ථයි;

අනතිරිය පව්කලහු ඔබ නොදක්නාහු, **එසඳ මහ** දනෝ නිවන් දක්නාහ දක්නාහු.

14 **තසඳකරු අයුකල් එකබසනම්**, පෙරතෝ සුසිරි කෙළෙහි කෙළෙහිය, පෙරතෝ බත්පිසුයෙහි පිසුයෙහිය, පෙරතෝ මෙලෙහි මෙලෙහිය, පෙරතෝ තුටුවූයෙහි තුටුවූයෙහිය. **බුහුබසනම්,** පෙර තෙපි පින්කලාහු කලාහුය, පෙර තෙපි බත්පිසුවාහු පිසුවාහුය, පෙර තෙපි මලාහ මලාහුය, පෙර තෙපි තුටුවූවාහ තුටුවූවාහුය.

---

අනතිරියපව්, ආනන්තර්‍යය පාප; කලහු, කළතැනැත්තෝ; ඔබ, උත්වහන්සේ; නොදක්නාහු, නොදක්නෝයි; එසඳ, ඒකාලයෙහි, මහදනෝ, මහජනයෝ තුමූ; නිවන් දක්නාහ, නිර්වාණය දකින්නාහ; දක්නාහු, යනුද මෙම අර්ථයි.

14 තසඳකරු, තශබ්දකාරක; අයුකල්, අතීතකාලික; එකබසනම්, එකවචනයනම්, පෙර, පූර්වයෙහි; තෝ සුසිරිකෙළෙහි, තෝ සුචරිතය කෙළෙහිය; කෙළෙහි යනුද මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෝ බත්පිසුයෙහි, තෝ භක්තපචනය කෙළෙහිය; පිසුයෙහිය යනුද මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෝ මෙලෙහි, තෝ මැරුණෙහිය; මෙලෙහිය යනුද මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෝ තුටුවූයෙහි, තෝ තුෂ්ටවූයෙහිය; තුටුවූයෙහිය යනුද මෙම අර්ථයි.

බුහුබසනම්, බහුවචනයනම්; පෙර, පූර්වයෙහි; තෙපි පින්කලාහු, තොපි කුසල්කලාහුය; කලාහුය යනුදු මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෙපි, තොපි තුමූ; බත්පිසුවාහු, භක්තපචනය කලාහුය; පිසුවාහුය යනුදු මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෙපි, තොපි තුමූ; මලාහ, මැරුණාහුය; මලාහුය යනුදු මෙම අර්ථයි; පෙර, පූර්වයෙහි; තෙපි තුටුවූවාහුය, තොපි සන්තුෂ්ටවූවාහුය; තුටුවූවාහුය යනුදු මෙම අර්ථයි.

15 **තසදකරු වත්මන් කල් එකබසනම්**, දූන් තෝ සුසිරිකෙරෙහි, දූන් තෝ බත්පිසෙහි, දූන්තෝ මැරෙහි, දූන් තෝ තුටුවෙහි. **බුහුබසනම්**, දූන් තොපි පින් කරන්නව කරව්, දූන් තොපි බත් පිසන්නව පිසව්, දූන් තොපි මැරෙන්නව මැරෙව්, දූන් තොපි තුටුවන්නව තුටුවව්.

16 **තසදකරුඅනාකල් එකබසනම්**,මතු තෝසෙත්පුර අත්පත්කරන්නෙහි, මතුතෝ දිවසුවලබන්නෙහි, මතුතෝ රජවන්නෙහි, මතු තෝ ජයගන්නෙහි,

---

15 තසදකරු, තසබ්දකාරක;වත්මන්කල්, වර්තමානකාලික; එකබසනම්, එකවචනයනම්; දූන්,මේකාලයෙහි; තෝ සුසිරිකෙරෙහි, තෝ සුචරිතය කෙරෙහිය; දූන්, මේකාලයෙහි; තෝ බත්පිසෙහි, තෝ භක්තය පචනයකෙරෙහි; දූන්, මේකාලයෙහි; තෝ මැරෙහි, තෝ මැරෙහිය; දූන්, මේකාලයෙහි; තෝ තුටුවෙහි; තෝ සන්තෝෂවෙහිය; බුහුබසනම්, බහුවචනයනම්; තොපි, තෙපි තුමූ; පින්කරන්නාව, කුසල් කරන්නාහු; කරව්, කරපියව්; දූන්, මේකාලයෙහි; තොපි, තෙපි තුමූ; බත්, භක්තය; පිසනනාව, පචනය කරනනාහු, පිසව්,උයාපියව්; දූන්, මේකාලයෙහි;තොපි, තෙපි තුමූ; මැරෙනනාව, මැරෙනනාහු; මැරෙව්, මැරෙව්; දූන්, මේකාලයෙහි; තොපි, තෙපි තුමූ; තුටුවන්නව, සන්තෝෂවන්නාහු;තුටුවව් යනුද මෙමඅර්ථයි.

16 තසදකරු, තශබ්දකාරක; අනාකල්, අනාගතකාලික; එකබසනම්, එකවචනයනම්; මතු, අනාගතයෙහි; තෝ, නුබතෙම; සෙත්පුර, ශාන්තිපුරය; අත්පත්කරන්නෙහි, හස්තප්‍රාප්ත කරන්නෙහි; මතු,අනාගතයෙහි; තෝ, නුබතෙම; දිවසුව, දිව්‍යසැපය; ලබන්නෙහි,ලැබීමකරන්නෙහි;මතු, අනාගතයෙහි;තෝ රජවන්නෙහි, තෝ නරේන්ද්‍රවන්නෙහිය; මතු,අනාග

**බුහුබසනම්,** මතු තෙපි සෙත්පුර අත්පත් කරන්නාහු, මතු තොපි දිවසුව ලබන්නාහු, මතු තොපි රජවනනාහු, මතු තොපි ජයගන්නාහු,

17 **මසදකරුඅයුකල් එකබසනම්,** පෙර මම පින් කෙලෙම් කෙලෙම් කෙලෙම්ලු, පෙර මම බත්පිසිමි පිසූයෙම් පිසූයෙම්ලු, පෙර මම රජවීමි රජවූයෙම්ලු පෙර මම ජයගතිමි ජයගතිම් ජයගතිම්ලු.

**බුහුබසනම්.** පෙර අපි පින් කලමු කලමෝ කළමුලු

---

නයෙහි; තෝජයගන්නෙහි, තෝ දිනිමගන්නෙහි යි; බුහුබසනම්,බහුවචනයනම්; මතු,අනාගතයෙහි; තෙපි, යුෂ්මත්හු; සෙත්පුර, ශාන්තිපුරය; අත්පත්කරන්නාහු, හස්තප්‍රාප්ත කරන්නාහු; මතු, අනාගතයෙහි; තොපි,යුෂ්මත්හු; දිවසුව, දිව්‍යසැප;ලබන්නාහු, විඳින්නාහු;මතු, අනාගතයෙහි; තොපි,යුෂ්මත්හු; රජවන්නාහු, රජවන්නාහු; මතු, අනාගතයෙහි; තොපි, යුෂ්මත්හු, ජයගන්නාහු, ජයග්‍රහණයකරන්නාහුය;

17 මසදකරු, මශබ්දකාරක; අයුකල්, අතීතකාලික; එකබසනම්, එකවචනයනම්; පෙර, පූර්වයෙහි; මම පින්කෙලෙම්, මම් කුසල්කෙළෙමි; කෙලෙම්, යනුද මෙමඅර්ථයි; කෙලෙම්ලු, කෙළෙම්ලු; පෙර, පූර්වයෙහි; මම බත්පිසිමි, මම්භක්තය පචනයකෙලෙමි; පිසූයෙම් යනුදු මෙමඅර්ථයි; පිසූයෙම්ලු, පචනයකෙලෙම්ලු; පෙර, පූර්වයෙහි; මම රජවිමි, මම් රජවූයෙමි; රජවූයෙම්ලු, රජවීම්ලු; පෙර, පූර්වයෙහි; මම ජයගතිමි, මම්ජයග්‍රහණය කෙළෙමි; ජයගතිම් යනුද මෙම අර්ථයි; ජයගතිම්ලු, ජයග්‍රහණය කෙළෙම්ලු.

බුහුබසනම්, බහුවචනයනම්; පෙර, පූර්වයෙහි; අපි, අෂ්මත්හු; පින්කලමු, කුසල්කෙළෙමු; කළමෝ යනුද

පෙර අපි බත්පිසමෝ පිසුමු පිසුමුළු, පෙරඅපි රජවූමු රජවිමු රජවීමුළු, පෙර අපි ජයගතිමු ජයගතුමෝ ජයගතුමුළු.

18 **මසදකරු වත්මන් කල් එකබසනම්**, මම දැන් පින් කෙරෙම් කෙරෙමි, මම දැන් බත්පිසෙම් පිසෙමි, මම දැන් ජයගණිම් ගණිමි.

**බුහුබසනම්,** අපි දැන් පින්කරමු, අපි දැන් බත්පිසමු, අපි දැන් රජවෙමු, අපි දැන් ජයගණිමු.

---

මෙම අර්ථයි; කලමුළු, කළෙමුළු; පෙර, පූර්වයෙහි, අපි, අපිතුමූ; බත්පිසමෝ, භක්තය පචනයකෙළෙමු; පිසුමු යනුද මෙමඅර්ථයි; පිසුමුළු, පචනයකෙළෙමුළු; පෙර, පූර්වයෙහි; අපි, අශ්මත්හු; රජවූමු, රජවූයෙමු; රජවිමු යනුද මෙම අර්ථයි; රජවීමුළු, රජවූනෙමුළු; පෙර, පූර්වයෙහි; අපිජයගතිමු, අපිජයග්‍රහණය කෙළෙමු; ජයගතුමෝ යනුද මෙම අර්ථයි; ජයගතුමුළු; ජයග්‍රහණය කෙළෙමුළු.

18 මසදකරු, මශබ්දකාරක; වත්මන්කල්, වර්තමානකාලික; එකබස නම්, එකවචනය නම්; මම දැන්, මම් මේ කාලයෙහි; පින් කෙරෙමි, කුසල්කරම්; කෙරෙම් යනුද මෙම අර්ථයි; දැන් මේකාලයෙහි; මම බත් පිසෙමි, මම් බත්උයම්; පිසෙම් යනුද මෙම අර්ථයි; දැන්, මේ කාලයෙහි; මම ජයගණිමි, මම් ජයග්‍රහණයකරම්; ගණිම්යනුද මෙම අර්ථයි.

බුහුබසනම්, බහුවචනය නම්; අපි, අස්මත්හු; දැන් මේ කාලයෙහි; පින් කරමු කුසල්කරමෝ; දැන්, මේ කාලයෙහි; අපි බත්පිසමු, අපි බත්උයමු; දැන්, මේකාලයෙහි; අපි රජ වෙමු, අපි ප්‍රථුවිපාලවෙමු; දැන්, මේ කාලයෙහි; අපි ජයගණිමු, අපි ජයග්‍රහණය කරමු.

19 **මසදකරු අනාකල් එකබසනම්**, මතුමම රහත්වනෙනම්, මතු මම නිවත්දකින්නෙම්, මතු මම ගුණදම් පුරන්නෙම්. **බුහුබසනම්** මතු අපි රහත්වන්නෙමු. මතු අපි නිවත්දකින්නෙමු, මතු අපි ජයගන්නෙමු, මතු අපි ගුනදම් පුරන්නෙමු.

**ඉති තෙකල් කිරිය නිමි.**

**20 විදිකිරියනම්,** බමණ පනද බොජ, මහබාසැරදේ, මේකරු මේ පිසන්නේ, හිමි නුබ දහම් දෙසන්

---

19 මසදකරු, මශබ්දකාරක; අනාකල්, අනාගත කාලික; එකබසනම්, එකවචනයනම්; මතු, අනාගතයෙහි; මම රහත්වනෙනම්, මම් අර්හත්වනෙනම්; මතු අනාගතයෙහි; මම නිවන්දකින්නෙම්, මම නිර්වාණය දකින්නෙම්; මතු, අනාගතයෙහි; මම ගුනදම් පුරන්නෙම්, මම් ගුණධර්මය පූරණයකරන්නෙම්; බුහුබසනම්, බහුවචනයනම්; මතු, අනාගතයෙහි; අපි, අසමත්හු; රහත්වන්නෙමු, අර්හත්වන්නෙමු.

මතු, අනාගතයෙහි; අපිනිවන් දකින්නෙමු, අපිනිර්වාණය දර්ශනයකරන්නෙමු; මතු, අනාගතයෙහි; අපි අසමත්හු; ජයගන්නෙමු, ජයග්‍රහණය කරන්නෙමු; මතු, අනාගතයෙහි; අපි, අසමත්හු; ගුණදම්, ගුණධර්මය; පුරන්නෙමු, පූරණයකරන්නෙමු;

ඉති, මෙසේ; තෙකල්කිරිය, ත්‍රෛකාලික ක්‍රියාව; නිමි, සමාප්තයි.

20 විදිකිරියනම්, විධාන ක්‍රියාවනම්; බමණ, බ්‍රාහ්මණය; පනද, දෙවෙනිදවස්හි; බොජ, අනුභවකරව; මහබා, මහාබාහුවනතය; සැරදේ, චිරාත්කාලයක් ජීවත්වේවා; මේකරු, මෙහෙකරුතෙම; මේ, භක්තය; පිසන්නේ, පචනය කරන්නේය; හිමි, ස්වාමිනි; නුබ, තුබවහන්සේ; දහම්, ධර්මය; දෙසන්නේ, දෙසනාකු

නේ, ගුණෙකැත්නම් මෙහි බජව්, සජනෙනි යහක් දක්නු.

**21 ආසිකිරියනම්** සරසවිය මාමුවතඹරෙහි ඉස්බේවා, නර පවර වැජ ඹෙවා, දිය හිය කිරීමෙහි වත් වෙම්වා, හිම්සඳ කප්හිම් දිනේවා, අගමැහිඳුබෝකලක් පවතීවා, බුදුසසුන් පස්වා දහසක්කල් දිලේවා; ඔබ දහම් යුගතහිම් බැබලේවා.

22 **පෙරකිරිය** නම් බවනැවිතරා යහවිඳින්, පෙරුම්පුරා බුදුවූ, දවිටු කොබෙගොසින් රුකෝ, දිටුමගුල්

---

රත්නේ; ගුණෙකැත්නම්, ගුණයක් ඇත්නම්; මෙහි බජව්, මෙහි භජනයකරව්; සජනෙනි, සත්පුෂියෙනි; යහක්දක්නු,} යහපතක් දර්ශණය කරව්.

21 ආසිකිරියනම්, ආශිර්වාද ක්‍රියාවනම්; සරසවිය' සරසවතීතොම; මා මුවතඹරෙහි, මාගේ මුඛතාමරසයෙහි; ඉස්බේවා, විශ්‍රාමය කෙරේවා නොහොත් ශිමත්හරීවා; නරපවර, නරොත්තමය; වැජඹෙවා, ලීලොපෙත වේවා; දිය, ලොකයට; හියකිරීමෙහි, හිතකිරීමෙහි; වත්වෙම්වා, සමර්ථවෙම්වා; හිම්සඳ, සවාමීන්ද්‍රයා; කප්හිම්, කල්පසීමාවදක්වා; දිනේවා, ජයගණීවා; අගමැහිඳු, අග්‍රමන්ත්‍රීන්ද්‍රතෙම; බෝකලක්, බොහෝකාලයක්; පවතීවා, ප්‍රවතීනාඃවේවා; බුදුසසුන්, බුඩශාසනය; පස්වාදහස්කල්, අවුරුදුපන්දහස් කාලයක්; දිලේවා, දිලිසේවා; ඔබදහම්, උන්වහන්සේගේ ධර්මය; යුගතහිම්, කප්කෙළවර ඉම්කොට; බැබලේවා, භ්‍රාජිතවේවා.

22 පෙරකිරියනම්, පූර්වක්‍රියාවනම්; බවණැවිතරා; භවාර්ණවය තරණයකොට; යහවිඳින්, සුඛානුභවකෙරෙත්; පෙරුම්පුරා, පාරමී පූරණයකොට; බුදුවූ, බුඩවූයේය; දවිටු, පාර්ශ්වස්ථතමෙ; කොබෙගොසින්, කො

මතඹු දැකලා නැවැත්, කරණී පිරික්සාලාකරණු, බ
මර පොසොත්පතර මී බිලායේ, සගයන ගොසින්ලා
නහමච්, සුරපුරෙන් අවුත් මිනිස්ලොව උපනි.—

23 **මුසුකිරියනම්**, මරසක් තනමින් පැලා, නටමි
න් සරනි, කරමින්යේ, ලියමින් ඇවිදි, මුණිරිවි උදු
දෙන නිතුලුකැන් මිලියෙමිනි අතුරුදහන් බිජී.

24 **පියදු කිරියනම්**, සුදෙට මෙහෙකරු ලවාබත්
පිසවා, මහරජ ඇමතිලවා යුදකරවා, ඇදුරු අතවැසි

---

නැන්හි ගමණායකොට; රුකෝ, රක්ෂාවේද; දිටුමඟුල්,
දෘෂටමඞගලිකාතොම; මතඹු, මාතඞගපණ්ඩිතයන්; දැ
කලා, දශීනයකරලා; නැවැත්, නැවතුනී; කරණී,
කටයුතු; පිරික්සාලා කරණු, පරීක්ෂාකරලා කරණු;
බමර, භෘඞගතෙම; පොසොන්පතර, මල්පෙතිවල; මී
බීලායේ, මධුපානයකරලා යෙයි; සගයන, සවගීසැප
ය; ගොසින්ලා, ගමණයකරලා; නහමච්, බලච්;සුරපු
රෙන්, දිව්‍යපුරෙන්; අවුත්, ඇවිදින්; මිනිස්ලොව, ම
නුෂ්‍යලොකයෙහි; උපනී, උපන්නේයි.

23 මුසුකිරියනම්, මිශ්‍රක්‍රියාවනම්; මරසක්, මාරසෙ
නාතොමෙ; තනමින්, කම්පාවෙමින්; පැලා, පලාගි
යේය;නටමින්, නෘත්‍ය කරමින්;සරනි, හැසිරෙති; ක
මින්,අනුභවකරමින්; යේ, යයි; ලියමින්, ලේඛණය
කරමින්; ඇවිදි, ගමන්කරයි; මුණිරිවි, සර්වඥසූර්‍ය්‍යා;
උදුදෙන, උදිතවුකල්හි; නිත්උළුකැන්, නීරඑකනැමැ
ති තාරකාසමූහය; මිලියෙම්නි, මලානිකවෙමින්; අතු
රුදහන්, අන්තර්ධානය; බිජී, භජනයකෙළේය.

24 පියදුකිරියනම්, ප්‍රයොජ්‍ය ක්‍රියාවනම්; සුදෙට,
සූපජෝ්‍යෂ්ටතෙම;මෙහෙකරුලවා, අතවැසියාලවා; බ
ත්පිසවා, භක්තය පචනයකරවා; මහරජ, මහාරාජ
තෙම; ඇමැතිලවා, අමාත්‍යයන් ලවා; යුදකරවා, යුධ

ලවා සිප් හදරවා, අගවිප් දදුන්ලවා යාග කරවා, රඟ සොඬුම් මිතුරන්ලවා දූකෙලවා, ඉති සැකවින් තෙකල්කිරිය ඈ කිරිය වෙසෙස් නිමි.

---

කරවයි; ඇදුරු, ආචාර්‍ය්‍යතෙම; අතවැසිලවා, අන්තෙවාසිකයාලවා; සිප් හදරවා, සිල්ප සඞ්ඛායතනය කරවා; අගවිප්, අගබමුණුතෙම; දදුන්ලවා, බ්‍රාහ්මණයන් ලවා; යාගකරවා, යඥකරවා; රඟසොඬුම්, සුරාලොල් තැනැත්තෝ; මිතුරන් ලවා, මිත්‍රයින්ලවා; දූකෙළවා, සූදුකෙලවා;— ඉති, මෙසේ; සැකෙවින්, සංක්ෂේපයෙන්; තෙකල්කිරිය ඈ, ත්‍රෛකාලික ක්‍රියාදීවූ; කිරියවෙසෙස්, ක්‍රියාවිශෙෂණ; නිමි, සමාප්තයි.

-නිමි.



